සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

* පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට පිළිතුරු සපයන්න
* දෙවන කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

### I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

01. යසෝදරා දේවියගේ පියා වූයේ
    1. සුද්ධෝදන රජු 2. අමිතෝදන රජු 3. සුප්‍රබුද්ධ රජු 4. බිම්බිසාර රජු

02. මහාමායාදේවියේ මාපියන් ජීවත් වූයේ
    1. කපිලවස්තු පුරයේ 2. දෙව්දහ නුවර 3. කිඹුල්වත් නුවර 4. මගධ රටේ

03. සිදුහත් බෝසතාණෝ පැවිදි බවට පත්වූයේ
    1. යමුනා ගංතෙරදී 2. නේරංජා ගංතෙරදී
    3. මහවැලි ගංතෙරදී 4. අනෝමා ගංතෙරදී

04. මෛත්‍රී භාවනාවේ ආනිසංස සංඛ්‍යාව
    1. එකොළහකි 2. හතරකි 3. දොළහකි 4. අටකි

05. දෙමාපියන් තම දරුවනට ඉටුකළයුතු යුතුකමක් වන්නේ,
    1. ශිල්පය ඉගැන්වීම 2. පරම්පරාව රැක ගැනීම.
    3. අවශ්‍යතා ඉටුකරදීම 4. මිය ගිය පසු පින්දීම

- අංක 6 සිට 10 දක්වා ප්‍රකාශවල දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X ) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. මෙත්වැඩීමේ ආනිසංසයකි මිනිසුන්ට ප්‍රියවීම. ( )
07. අලීනතාවය යනු කම්මැලි වීමයි. ( )
08. සුද්දෝධන රජු තම පුතුට දෙවන වර වැන්දේ අසිත තාපසතුමාට පෙන්වූ දිනයි. ( )
09 වැරදි නොකර ඉන් වැළකීමෙන් පමණක් සීලය සම්පූර්ණ නොවේ. ( )
10. අනිත්‍යතාවය යනු වෙනස්වීමයි. ( )

- අංක 11 15 දක්වා ප්‍රශ්නවල A කොටසට අදාල B කොටසේ වගන්තිය තෝරා ඉරකින් යා කරන්න.

| | A | B |
|---|---|---|
| 11. | පස්වග තාපසයන් | දෙව්දහ නුවර |
| 12. | සුද්ධෝදන රජතුමා | බරණැස ඉසිපතනය |
| 13. | රාහුල හාමුදුරුවෝ | රජගහනුවර |
| 14. | මහාමායා දේවිය | අම්බලට්ඨිකා ආරාමය |
| 15. | බිම්බිසාර රජතුමා | කිඹුල්වත් පුරය |

● අංක 16 20 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට ගැලපෙන පිළිතුර තෝරා හිස්තැන් වල ලියන්න.

(යසෝදරා/කිසාගෝතමී/කම්මැලි නොවීම/ආනාපානසති භාවනාව/සුමන මල්කරු)

16. දියුණුවේ දොරටුවකි. ...............................

17. ශ්‍රද්ධාවෙන් යුතුව බුදුරදුන්ට මල් පූජාකළ ............................... රජතුමාගෙන් ද තෑගි බෝග ලැබීය.

18. නිබ්බුත පද ප්‍රකාශ කළේ ............................... දේවිය යි.

19. සුප්‍රසිද්ධ රජතුමාගේ දියණිය ............................... දේවිය යි.

20. වප් මගුල් දින බෝසත් කුමරු වැඩූ භාවනාව ........................................

## II කොටස

● පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

01. කෙටි පිළිතුරු ලියන්න.

01. සීලය යනු කුමක්ද?
02. සම්මා වාචා යනු වැරදි 04කින් වෙන්වීමයි. ඉන් දෙකක් නම් කරන්න.
03. ලොව පවතින සෑම දෙයකම ලක්ෂණය කුමක්ද?
04. දෙමාපියන් තම දරුවන්ට ඉටුකළයුතු යුතුකම් දෙකක් ලියන්න.
05. පස්වග තාපසයින් අතරින් දෙදෙනෙකු නම් කරන්න.
06. අපේ රටට ආවේනික ජාතික සංකේත 02ක් ලියන්න.
07. සතර බ්‍රහ්ම විහරණ වලින් දෙකක් නම් කරන්න.
08. සීලයේ ආනිසංස පහකි. එයින් දෙකක් නම් කරන්න.
09. රාහුල හිමිගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.
10. මෛත්‍රී භාවනාවේ ආනිසංස හතරක් ලියන්න.

02. i. විහාරස්ථානයට ගොස් ඔබ වන්දනා කරන ස්ථාන තුන පිළිවෙලින් ලියන්න.
ii. දහම් ගුණ පාඨය නිවැරදිව ලියන්න.
iii. විහාරස්ථානයේ දී අප අනුගමනය කළ යුතු වතාවත් 05ක් ලියන්න.

03. i. තංච කම්මං කතං සාධු .....යන ගාථාව සම්පූර්ණ කරන්න.
ii. එහි සරල අදහස ලියන්න.
iii. ඔබ සිදුකර ඇති යහපත් ක්‍රියා පහක් ලියන්න.

04. i. දියුණුවේ දොරටු 6ක් ගැන කියවෙන ජාතක කථාවේ නම ලියන්න.
ii. එහි සඳහන් දියුණුවීමේ දොරටු තුනක් ලියන්න.
iii. කම්මැලිකම ඉගෙනීමට බාධාවක් වන බව පෙන්වා දෙන්න.

05. i. නිවන්මග පියවර තුනකින් යුක්ත වේ. එය ත්‍රිවිධ ශික්ෂා ලෙස ද හඳුන්වයි. ඉන් දෙකක් නම් කරන්න.
ii. සම්මා කම්මන්තයට අයත් අංග තුන නම් කරන්න.
iii. නුදුන් දෙයක් සොර සිතකින් නොගන්නෙමි....... මෙම කවියෙහි ඉතිරි පද සම්පූර්ණ කරන්න.

06. i. දෙමාපිය දූදරු යුතුකම් ගැන කරුණු කියාදෙන සූත්‍රයේ නම ලියන්න.
ii. දරුවන් විසින් තම දෙමාපියන්ට ඉටුකළ යුතු යුතුකම් තුනක් ලියන්න.
iii. දෙමාපියන් සතුටු කිරීම සඳහා ඔබට කළ හැකි ක්‍රියා පහක් ලියන්න.

07. i. ජාතික ගීයෙහි නිර්මාතෘවරයා නම් කරන්න.
ii. ජාතික කොඩියෙහි පහත සඳහන් තීරු මගින් සංකේතවත් කරන්නේ මොනවාදැයි සඳහන් කරන්න.

a - බෝපත් හතර ..................................................................................................

b - සිංහයා ..................................................................................................

c - රතුපාට තීරුව ..................................................................................................

iii. එකමුතුව වැඩ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.